# වසන්මලේ සිතුවම් විනාශයට බලපා ඇති හායනකාරක

එස්. දිල්හානි[1], එස්.එම්. වීරසිංහ[2]

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බුලන්කුලම වැව ඉස්මත්තේ පිහිටා තිබෙන කුඩා කඳු ගැටයකි. එම කඳු ගැටය සාමාන්‍ය ජන ව්‍යවහාරයේදි "වසම්මලේ" හෙවත් "වසන්මලේ" නමින් ද "රාස්සගල" නමින් ද හැඳින්වේ. මෙම ප්‍රදේශයේ සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනක් ඇසුරෙන් කන්දේ දක්නට ලැබෙන සුවිශේෂි අංගය වන පර්වතයේ ශේෂව පවතින සිතුවම් අධ්‍යයනය කර හායනකාරක පිළිබඳව අධ්‍යයනය කරන ලදි. මෙමගින් මිහින්තලය හාත්පස ගල්ලෙන්වල පැරණි යුගයේ බිතුසිතුවම් පැවති බවට තහවුරු වේ. එම නිසාම මෙම ප්‍රදේශය "චිත්‍ර ගල" යනුවෙන් ද හඳුන්වනු ලැබේ. මෙම චිත්‍ර ගලෙහි සිතුවම් 1988 වර්ශයේදි ඒ. ලගමුව වාර්තාකරන ලද අවස්ථාවේ තිබුණු තත්ත්වයන්ට වඩා මේ වනවිට ඒවා තවදුරටත් විනාශ වී නොපැහැදිලි තත්ත්වයට පත්ව තිබේ. එම විනාශය අවමකර මෙම සිතුවම් ආරක්ෂා කිරිමට බලධාරින්ගේ අවධානය යොමු කරවීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම ගල් ලෙන තුළ ඇඳ ඇති සිතුවම් මේ වනවිට භෞතික හා ජිවවිද්‍යාත්මක හේතුනිසා එහි වැඩි ප්‍රමාණයක් විනාශයට ගොසින් තිබේ. දැනට ශේෂව ඇති කොටසෙහි නාග මානව රූපයක් හා අප්සරා රුවක් හඳුනාගත හැකිය. එය ද පහසුවෙන් හඳුනාගත නොහැකි ලෙස විනාශ වී ඇති බව පෙනේ. ඉහත සිතුවම් හායනය වීමට වැස්ස, සුළඟ, අව්ව, පින්න ආදි ස්වාභාවික හායනකාරක සෘජුවම බලපා ඇති බව පෙනේ. මෙම ස්වාභාවික හායන අතර වර්ෂාව හේතුවෙන් කටාරය දියවගොස් තිබේ. පර්වතය ඉහළට වැටෙන වර්ෂා ජලය චිත්‍ර ගලෙහි මුදුනේ සිට පහළට රුරා වැටේ. මෙසේ ජලය ගලා යාමේ දී සිතුවම සෝදා යාම සිදුවේ. සිතුවම් ගල නැගෙනහිර දෙසට මුහුණලා පිහිටා ඇත. එබැවින් සූර්යාලෝකය සෘජුවම සිතුවමට පතිත වේ. මේ හේතුවෙන් ද සිතුවමේ ඇති වර්ණය අවපැහැ ගැන්වී එම වර්ණ කොටස් කුඩා කුඩු ආකාරයට ගැලවි යනු දැකිය හැකිය. මීට අමතරව තෙතමනය හේතුවෙන් අලු පැහැයට හුරු දිලීර හෝ ලයිකන වර්ධනය වීම ද හඳුනාගත හැකිය. එසේම මිනිසුන් විසින් ලියා ඇති කුරුටු සටහන් බෝහෝමයක් ද දක්නට ලැබේ. එමගින් මානව ක්‍රියා හේතුවෙන් වූ හානිකාරක රැසක් සිතුවම්වලට සිදු වී ඇති බව හඳුනාගත හැකිය. මෙවැනි අගනා වූ සිතුවමක් ආරක්ෂාකර ගැනීම සිදුකිරිම අනිවාර්ය කටයුත්තකි. කැළෑ රොදකින් වටවී ඇති මෙම ප්‍රදේශයේ මෙවැනි ස්ථානයක් හඳුනාගැනීම අසීරුය. මෙම ස්ථානය සුද්ද පවිත්‍රකර එම ස්ථානයට පහසුවෙන් ළගාවීමට මාර්ගයක් ඉදිකළ යුතුය. එමෙන්ම චිත්‍ර ගලෙහි දැනට ශේෂව පවතින සිතුවම් ආවරණය වනසේ වහළයක් හා චිත්‍ර සඳහා අවරණයක් ඉදිකිරිමට ද පියවර ගතයුතු බව මෙම අධ්‍යයනයේදී හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද : මිහින්තලය, වසම්මලේ, සිතුවම්, හායනකාරක, ආරක්ෂා කිරිම

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.sadunigunarathna3@gmail.com